*සැ. යු.* - 2019.02.22 වැනි දින පළ වූ අංක 2112 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,113 - 2019 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2019.03.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 46 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 50 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 22 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතෙහි 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහියංගනය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. එම්. යූ. අයි. එන්. කේ. දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1996.03.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/විල්/ජ/1431 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 02, දේවගිරිය පදිංචි තැන්නේ හේනේ ගෙදර රම්බරණා වෙත ප්‍රදානය කොට, මාතලේ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ම/ප්‍ර/වි/1431/3943/96 යටතේ 1996.07.09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.03.15 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලග්ගල-පල්ලේසිය පත්තුවේ/කෝරළේ දේවගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දේවගිරියගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ අංක අ.ජ.පි.මා. 10 දරන කට්ටි කැබීමේ පිඹුරේ 40 ගෙවත්ත දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 01, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : දේවගිරිය ගම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | ප්‍රවේශ මාර්ග රක්ෂිතය; |
| *නැගෙනහිරට* | - | කැ. අ. 39 ඉඩම; |
| *දකුණට* | - | 25 ඇල රක්ෂිතය; |
| *බටහිරට* | - | කැ. අ. 41. |

ඩී. එම්. යූ. අයි. එන්. කේ. දිසානායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය,
මහියංගණය.

2018 දෙසැම්බර් මස 19 වැනි දින.

03 - 34/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතෙහි 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහියංගනය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. එම්. යූ. අයි. එන්. කේ. දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1996.03.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/විල්/ජ/1437 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 02, දේවගිරිය පදිංචි තැන්නේ හේනේ ගෙදර රම්බරණා වෙත ප්‍රදානය කොට, මාතලේ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ම/ප්‍ර/වි/1437/3950/96 යටතේ 1996.07.09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.03.15 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලග්ගල-පල්ලේසිය පත්තුවේ දේවගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දේවගිරිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ අංක අ.ජ.පි.මා. 10 දරන කට්ටි කැබීමේ පිඹුරේ 134 මඩ දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 01, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : දේවගිරිය ගම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | ඇල හා ප්‍රවේශ මාර්ග රක්ෂිතය; |
| *නැගෙනහිරට* | - | අන්දින්නාපාන ඇල රක්ෂිතය; |
| *දකුණට* | - | ඇල හා ප්‍රවේශ මාර්ග රක්ෂිතය, අන්දින්නාපාන ඇල රක්ෂිතය; |
| *බටහිරට* | - | කැ. අ. 135. |

ඩී. එම්. යූ. අයි. එන්. කේ. දිසානායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය,
මහියංගණය.

2018, දෙසැම්බර් මස 19 වැනි දින.

03 - 34/2

### ඉඩම් සංවර්ධන ආඥාපනතෙහි 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් හත්තසිංහගේ තිලකවර්ධන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1992.12.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/728 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අම්බලන්තොට වාඳුරුප්ප ලිපිනයෙහි පදිංචි මහමඩකලපුවගේ ඔම්නෝනා වෙත ප්‍රදානය කොට ඇති පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍ර උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2019.04.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම්පත්තුවේ / වාඳුරුප්ප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වලව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් නැත 00, රූඩ් නැත 00, පර්චස් 39.8 ක විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලොට් 2 දරන ඉඩම් කැබැල්ල; |
| *නැගෙනහිරට* | - | ලොට් 3 දරන මාර්ග රක්ෂිතය; |
| *දකුණට* | - | ලොට් 14 දරන ඉඩම් කැබැල්ල; |
| *බටහිරට* | - | ලොට් 1 දරන මාර්ග රක්ෂිතය. |

එච්. තිලකවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

03 - 35/6

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩී. එල්. කේ. ප්‍රියවංශ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලංකාණ්ඩුව විසින් 1997.06.05 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/12/ප්‍ර 45442 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන තිස්සමහාරාම, ජූල්පල්ලම, කු.ග. 09 ලිපිනයේ පදිංචි ඉද්දමල්ගොඩ මොහොට්ටි කංකානම්ගේ ධනපාල වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හ/302/2863/99 යටතේ 1999.08.03 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.04.05 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම්පත්තුවේ ජූල්පල්ලම ග්‍රාම නිලධාරි කොට්ඨසයේ ව.ඉ.කු.ග. 9 නමැති ගමේ පිහිටා ඇත්තා වූ හම්බන්තොට දිස්ත්‍රික් මැනුම් අධිකාරි භාරයේ ඇති සර්වේ කුඩා ගම්මාන 09 කට්ටි කැඩීමේ සැලැස්මට අනුව පෙන්නුම්කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර 02 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | 585 වගා ඉඩම; |
| *නැගෙනහිරට* | - | එෆ්/සී 34 කෙත් ඇල; |
| *දකුණට* | - | 587, සහ 588 වගා ඉඩම්; |
| *බටහිරට* | - | බස්නා ඇල ද වේ. |

ඩී. එල්. කේ. ප්‍රියවංශ,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාම.

2019 ජනවාරි මස 23 වැනි දින.

03 - 35/5

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම-(104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාංචනා කුමාරි තල්පාවිල වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.05.26

වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/11995 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අම්බල පදිංචි වික්‍රමසිංහ පියසේන වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3574 යටතේ 1988.11.04 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.04.05 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු ගිරුවා පත්තුවේ අම්බල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අම්බල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. සි. දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 300 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 341 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 00, රූඩ් 01, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මිරිස්වත්ත නොහොත් ඕවර්සියර්වත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලොට් 344 ප්‍රවේශ මාර්ගය; |
| *නැගෙනහිරට* | - | ලොට් 340 සහ 342 ඉඩම්; |
| *දකුණට* | - | ලොට් 340 ඉඩම; |
| *බටහිරට* | - | ලොට් 337 ප්‍රවේශ මාර්ගය. |

කාංචනා කේ. තල්පාවිල,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2018 අගෝස්තු මස 29 වැනි දින.

03 - 35/4

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම-(104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාංචනා කුමාරි තල්පාවිල වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985.03.05 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/2634 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගැටමාන්න පදිංචි විල්පිට ජයවර්ධනගේ කරෝලිස් වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 409 යටතේ 1985.08.09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.04.05 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුවේ ගැටමාන්න දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගැටමාන්න නමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 296 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 1294 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.161 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලොට් 1295 දරන ඉඩම් කැබැල්ල; |
| *නැගෙනහිරට* | - | ලොට් 1297 දරන ඉඩම් කැබැල්ල; |
| *දකුණට* | - | ලොට් 1293 දරන රක්ෂිත මාර්ගය; |
| *බටහිරට* | - | ලොට් 1293 දරන රක්ෂිත මාර්ගය. |

කාංචනා කේ. තල්පාවිල,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2018 අගෝස්තු මස 29 වැනි දින.

03 - 35/3

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම-(104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාංචනා කුමාරි තල්පාවිල වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.10.09 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/7116 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු ගලගම පදිංචි උලුවඩුගේ විල්මන් වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 675 යටතේ 1988.04.06 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය

අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.04.05 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුවේ ගලගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගලගම නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 301 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 423 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.402 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : හිගුරුවැල්පොකුණවත්ත

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලොට් 421 දරන ප්‍රවේශ මාර්ගය; |
| *නැගෙනහිරට* | - | ලොට් 424 දරන ඉඩම් කැබැල්ල; |
| *දකුණට* | - | ලොට් 431 දරන ඉඩම් කැබැල්ල; |
| *බටහිරට* | - | ලොට් 422 දරන ඉඩම් කැබැල්ල. |

කාංචනා කේ. තල්පාවිල,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2018 අගෝස්තු මස 29 වැනි දින.

03 - 35/2

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාංචනා කුමාරි තල්පාවිල වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985.03.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/2653 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගැටමාන්න පදිංචි ගීගන ගමගේ දාවිත්හාමි වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 428 යටතේ 1985.08.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.04.05 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුවේ ගැටමාන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගැටමාන්න නැමති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 296 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 1248 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.219 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : තොලපොතයාවත්ත,

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලොට් 1249 දරන ඉඩම් කැබැල්ල |
| *නැගෙනහිරට* | - | ලොට් 1271 සහ 1272 දරන ඉඩම් කැබලි |
| *දකුණට* | - | ලොට් 1293 දරන රක්ෂිත මාර්ගය |
| *බටහිරට* | - | ලොට් 1247 දරන රක්ෂිත මාර්ගය. |

කාංචනා කේ. තල්පාවිල,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2018 අගෝස්තු මස 29 වැනි දින.

03 - 35/1

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ජම්ජුදා පුවිලිංගම් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජුනි 27 වැනි දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි. ප්‍ර. 1140 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කන්තලේ, ගන්තලාව, යුනිට් 11, අංක 869 පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ උක්කු බණ්ඩා වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LD/I/09/15 යටතේ 1986.09.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී

ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.03.15 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

ත්‍රිකුණාමල පරිපාලන දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්තලේ පත්තුවේ 227 ඒ වෙන්ඩ්‍රාසන්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගන්තලාව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එෆ්. සි. පි. ත්‍රි 54 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 102 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ්. 00, පර්. 12 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 64, 65 හා 101, |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 101, 106 හා 105, |
| *දකුණට* | - | කැබලි අංක 105 හා 61, |
| *බටහිරට* | - | කැබලි අංක 61 හා 64. |

ජම්පුදා පුවිලිංගම්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
කන්තලේ.

2018 දෙසැම්බර් මස 14 වැනි දින.

03 - 60/1

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ජම්පුදා පුවිලිංගම් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2001 අප්‍රේල් 27 වැනි දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි. කන්.ප්‍ර. 7867 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කන්තලේ ත්‍රිකුණාමල පාර, සංඝමිත්තා මාවත පාර, අංක 192/ඒ පදිංචි බැමිණි හැන්නදිගේ ඩැනියෙල් ක්ලයිනෝ පීරිස් වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/P/04/05 යටතේ 2013.08.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.03.15 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

ත්‍රිකුණාමල පරිපාලන දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්තලේ පත්තුවේ කන්තලේ ග්‍රාම නිලධාරි කොට්ඨසයේ කන්තලේ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01, පර්. 00ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | රජයේ ඉඩම |
| *නැගෙනහිරට* | - | රජයේ ඉඩම, |
| *දකුණට* | - | අතුරු පාර. |
| *බටහිරට* | - | ගුණරත්න බණ්ඩාගේ ඉඩම. |

ජම්පුදා පුවිලිංගම්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
කන්තලේ.

2018 දෙසැම්බර් මස 14 වැනි දින.

03 - 60/2

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/56896.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
අම්/නිඉකො/දීබ/7(සේනා).

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සේනානායකපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සේනානායකපුර ගමේ 280010 පිඹුරේ කැබලි අංක 11 සහ 12 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.129 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සංචාරක හෝටලය සහ නිවාඩු නිකේතනය පවත්වාගෙන යාම සඳහා වාණිජ පදනමින් වුලාන්ජන් ලහිරු සම්පත් විතානගේ විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :-

කැබලි අංක 11,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 10 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 04 ; |
| *දකුණට* | : | කැබලි අංක 12 ; |
| *බටහිරට* | : | කැබලි අංක 13. |

කැබලි අංක 12,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 11 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 04 ; |
| *දකුණට* | : | කැබලි අංක 14 ; |
| *බටහිරට* | : | කැබලි අංක 13. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2019.01.10 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ගරු ඇමතිතුමා අනුමත කරන දිනයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. ගරු ඇමතිතුමා අනුමත කරන දිනයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ. ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය. ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.;

*(උ)* ගරු ඇමතිතුමා අනුමත කළ දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම* නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 මාර්තු මස 01 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-107

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/52119.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
NP/28/04/2/SLO/45/1127.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ආනන්දපුරම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ආනන්දපුරම් ගමේ KN/KR/LB/W.Tank/2015 දරන අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් අක්කර 1/2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර ; |
| *නැගෙනහිරට* | : | පාර ; |
| *දකුණට* | : | රජයේ ඉඩම ; |
| *බටහිරට* | : | කුණු ඇළ. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2018.06.25 දින සිට 2048.06.24 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- ගරු ඇමතිතුමා අනුමත කළ වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ. ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය. ;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.;

(උ) 2018.06.25 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 මාර්තු මස 01 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-109

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/57002.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
NP/28/04/02/SLO/44-Hidramani (PKI)

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුදුකුඩිඉරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ 10 වන කොට්ඨාසය ගමේ දළ අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් අක්කර 07 රූඩ් 02ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා හයිඩ්‍රාමනී ක්ලෝතින් (පුද්ගලික) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ : -

*උතුරට* : රජයේ ඉඩම ;
*නැගෙනහිරට* : පාර ;
*දකුණට* : රජයේ ඉඩම ;
*බටහිරට* : ප්‍රධාන පාර.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.01.10 දින සිට 2049.01.09 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරුව වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන

තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ. ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.01.10 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

